# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/13 - 2021 නොවැම්බර් මස 24 වැනි බදාදා - 2021.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කාමර 652 කින් යුත් මැරීනෝ ටවර් සිටි හෝටල් ව්‍යාපෘතිය
අංක 594, ගාලු පාර, කොළඹ 03

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මඟින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව අංක 361, නුවර පාර, නිට්ටඹුව දරන ලිපිනයේ දම්රෝ ලෙෂර් පෞද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 03, ගාලු පාර, අංක 594 දරන ස්ථානයේ ඉදිකිරීමට යෝජිත කාමර 652කින් යුත් හෝටල් ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2021.11.24 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර).

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මඟින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.
02. මධ්‍යම පරිසර අධිකාරිය, නො. 104, ''පරිසර පියස'', ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
03. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ.
04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිඹිරිගස්යාය.
05. මහනගර සභාව, කොළඹ.


1A - G 35406 - 30 (2021/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2021.11.24 දින සිට දින 30 ක් ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**ඉංජිනේරු ආර්. ඒ. එස්. රණවක,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත, කොළඹ 10.

දුරකතන අංක : 011-2449754, 011-2387922, 011-2449197
ෆැක්ස් අංක : 011-2438005, 011-2472623

12-29